# FPA පුවත් සංග්‍රහය

2017 දෙවන කලාපය

www.fpasrilanka.org

තිරසාර සංවර්ධන ඉලක්ක ජයගනිමු...

## පාසල් තුළ ලිංගික අධ්‍යාපනය සඳහා ගුරු පුහුණුව ඇරඹේ



ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය තුසිතා විජේමාන්න මහත්මිය

අප රට තුළ පාසල් දරුවන් ලිංගික හිංසනයෙන් වළක්වා ගැනීමත්, නිසි වයසට පෙර සිදුවන ගැබ් ගැනීම් වලින් දැරියන් ආරක්ෂා කර ගැනීමත් ප්‍රධාන වශයෙන් අරමුණු කරගෙන 6 වසර සිට 13 වසර පාසල් සිසු සිසුවියන් සඳහා ලිංගික අධ්‍යාපනය ලබා දීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාව තීරණය කර ඇත.

මේ සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස බස්නාහිර පළාතේ ගුරුවර ගුරුවරියන් පුහුණු කිරීම පසුගිය ජූනි මාසයේ සිට ආරම්භ කර තිබේ. මෙම ගුරුවර ගුරුවරියන් සඳහා ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය ඉගැන්වීමේ මාර්ගෝපදේශනය සහිත අත්පොතක් ද අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කිරීම මෙම කටයුතු විධිමත් කිරීමට රුකුලක් වනු ඇත.

ආංශික අධීක්ෂණ කාරක සභාවේ ගරු සභාපති ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීනි වෛද්‍ය තුසිතා විජේමාන්න මහත්මිය කටයුතු කරයි.

**පසු සටහන**

වසර 65 ක ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ඉතිහාසය තුළ ලිංගික අධ්‍යාපන අවශ්‍යතාව නිරන්තරයෙන් අවධාරණයට ලක්කර ඇත.

"පරිපූර්ණ ලිංගික අධ්‍යාපනයක - විද්‍යාත්මක ප්‍රවේශය පාසලට" තේමා කරගනිමින් පසුගිය දෙසැම්බර් මාසයේ සිට ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාව ගත් මෙම තීරණය අප සංවිධානයේ පැසසුමට ලක් වනු ඇත.

## 'අපේ සෙනෙල්' ට මහ රැජිනගෙන් සම්මාන



සෙනෙල් වන්නිආරච්චි මහතා දෙවැනි එලිසබෙත් මහරජන අතින් සම්මාන ලබමින්...

පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල තරුණ නායකයින් උදෙසා වන බ්‍රිතාන්‍යයේ දෙවැනි එලිසබෙත් මහ රැජින අතින් පිරිනැමෙන සම්මාන ප්‍රදානයේ දී ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ සෙනෙල් වන්නිආරච්චි මහතාට සම්මානයක් හිමිවිය. (2017 QUEEN'S YOUNG LEADER) සෙනෙල් වන්නිආරච්චි ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ අධිවාචන සහ සන්නිවේදන කළමණාකරු ලෙස කටයුතු කරයි.



## ගංවතුරෙන් සහ නායයෑමෙන් විපතටපත් කාන්තාවන් සහ ගර්භනී මව්වරුන්ට ආධාර රැගෙන දිස්ත්‍රික්ක 7 කට...

පසුගිය මැයි මාසයේ සිදු වූ මහා ගංවතුර තත්ත්වය සහ දරුණු නායයෑම් මඟින් අවතැන් වූ පිරිස් අතර සිටින කාන්තාවන් සහ ගර්භනී මව්වරුන් සඳහා සෞඛ්‍යාරක්ෂිත මූලික අවශ්‍ය ද්‍රව්‍ය සහිත කට්ටල ලබාදීම සිදුවිය. සැලසුම් කළ මාපිය භාවය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය විසින් ඕස්ට්‍රේලියානු රජයේ ආධාර යටතේ සහ එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල මඟින් මෙම ආධාර ලබා දී ඇති අතර ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය විසින් බෙදාදීම සිදුකරන ලදි. ගංවතුර සහ නායයෑමෙන් වැඩිම පීඩාවක් වූ රත්නපුර, ගාල්ල, මාතර, කළුතර, කෑගල්ල, හම්බන්තොට සහ ගම්පහ දිස්ත්‍රික්කවලට මෙම ආධාර ලබාදී තිබේ.

ආපදා කළමණාකරන මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා රතුකුරුස සමාජය ද මේ සඳහා සහයෝගය දැක්විය.

## නව කාර්යාල සංකීර්ණය විවෘත කිරීම





ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ නව කාර්යාල සංකීර්ණය පසුගිය අගෝස්තු මාසයේ විවෘත කරන ලදි. මහල් සයකින් සමන්විත මෙම ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ නාරාහේන්පිට - නාවල ප්‍රධාන මාර්ගයට සමීපවය.

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ හිටපු ගරු සභාපති විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය අතින් විවෘත වූ මොහොත. ගරු සභාපති චන්දිම ගුණවර්ධන මහතා සහ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ මහත්මිය ද ඡායාරූපයේ වෙති.

## 46 වන වාර්ෂික මහා සභාව



*ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ 46 වැනි වාර්ෂික මහා සභා රැස්වීම, ප්‍රධාන කාර්යාලයේ දී පසුගියදා පැවැත්වුණි. පත්වූ නිලධාරි මණ්ඩලය සහ ජාතික මණ්ඩල සාමාජික සාමාජිකාවන් සමූහ ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව.*

### නිලධාරි මණ්ඩලය

ගරු සභාපති චන්දිම ගුණවර්ධන මහතා, ගරු උප සභාපති විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය, ගරු ලේකම් වෛද්‍ය එස්තර් අමරසේකර මහත්මිය, ගරු භාණ්ඩාගාරික එරල් ස්මිත් මහතා, ගරු සහය ලේකම් සාරා සොයිසා මහත්මිය, ගරු සහය භාණ්ඩාගාරික සචිනි උඩුවෙල මෙනවිය

### තාක්ෂණික උපදේශක කමිටු

වෛද්‍ය කමිටුව - ගරු සභාපති විශේෂඥ වෛද්‍ය ලසන්ත මලවිගේ මයා, තොරතුරු, අධ්‍යාපන සහ සන්නිවේදන කමිටුව - ගරු සභාපති වෛද්‍ය ශ්‍රියානි බස්නායක මහත්මිය, මූල්‍ය හා පරිපාලන කමිටුව - ගරු සභාපති කාමිල් මොහොමඩ් මහතා, තරුණ කමිටුව - ගරු සභාපති ප්‍රිස්කිලා අරුල්ප්‍රගාසම් මෙනවිය

## ඇගයීම් සහ නියාමන තාක්ෂණික මඟපෙන්වීම් සඳහා භූතානයට



ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ නියාමන සහ ඇගයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ සුචිර සුරංග මහතා සැලසුම් කළ මා-පියභාවය පිළබඳ ජාත්‍යන්තර සම්මේලනයේ සාමාජික භූතානයේ RENEW සංවිධානයට නියාමන සහ ඇගයීම් පිළිබඳ තාක්ෂණික සහයෝගිතාව ලබාදීම සඳහා භූතානයේ සංචාරයකට එක්විය.

එමෙන්ම ඒ මහතා බ්‍රිතාන්‍යයේ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ජනගහන පර්යේෂණ පිළිබඳ පුහුණුවක් සඳහා ද සහභාගී විය.



# FPA පුවත් සංග්‍රහය
2017 දෙවන කලාපය

ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට
අමතන්න 2 588 488
පිවිසෙන්න www.happylife.lk
SMS කරන්න 071 6 408 408

www.fpasrilanka.org
තිරසාර සංවර්ධන ඉලක්ක ජයගනිමු...
37/27, බුලර්ස් පටුමග, කොළඹ 07. දුරකථන : 011 2 555 455
ෆැක්ස් : 011 2 55 66 11 ඊ මේල් : fpa@fpasrilanka.org



"ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යය සහ අයිතීන් සෑම දෙනාගේ මානව අයිතියක්. අද සමාජයේ අසන්නට ලැබෙන හිංසනය, දූෂණය සහ අපචාරවලට බලපාන්නේත් මේ දැනුම ලබාදීමේ අඩුපාඩුකම්ය. පරිපූර්ණ ලිංගික අධ්‍යාපනයක් තුළින් දරුවන් තරුණ පරපුර අනාගතයට ශක්තිමත් ලෙස පා තබන්නට සවිබල ගන්වමු."

*තුෂාරා රණසිංහ*
විධායක අධ්‍යක්ෂිකා
ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය

## දැනගනිමු ජය ගනිමු!

ඔබේ ලිංගික සෞඛ්‍ය අයිතීන් වෙනුවෙන්

## දරුවන් වෙනුවෙන් ම

වගකීම ඉටු කරමු
නිසි මඟ පෙන්වමු



"වැඩිවියට පත්වෙමින් සිටින දරුවන් තමන්ගේ ලිංගික හැඟීම් පාලනය කර ගැනීම තුළින්, ඔවුන්ට අධ්‍යාපන වගකීම්, සමාජ වගකීම් ඉටු කිරීමට ඔවුන් තුළ හොඳ ආත්ම විශ්වාසයක් ගොඩ නැගෙනවා. එමගින් අනවශ්‍ය ලිංගික, ආදර හෝ මානසික ව්‍යාකූලත්වයන්ට පත්වීම ද වළක්වනවා. එම නිසා ලිංගික අධ්‍යාපනය දැඩි තීව්‍රතාවකින් වැඩිවියට පත්වන දරුවන්ට ලබාදිය යුතුයි."

මනෝ වෛද්‍ය විශේෂඥ
*කපිල රණසිංහ*

## පරිපූර්ණ ලිංගික අධ්‍යාපනයක විද්‍යාත්මක ප්‍රවේශය පාසලට

This project is funded by The European Union

NATIONAL STD/AIDS CONTROL PROGRAMME

IPPF International Planned Parenthood Federation
South Asia Region

www.happylife.lk | www.fpasrilanka.org

fpa SRI LANKA enriching relationships



## CERTIFICATE COURSE
### IN COUNSELLING SKILLS DEVELOPMENT

### Why Join?

- It is an opportunity to.
- observe actual cases in a real counselling setting, conducted by experienced Counselors
- Role plays and Video/Audio feedback (Practicing Counselling Techniques)
- Practice counselling skills with real clients with individualized attention


### Course Content

- Basic Counselling Skills
- Effective Communication Skills
- Counselling Approaches & Techniques
- Case Management
- Intervention in Disaster Management
- Sexual Transmitted Infections
- Sexual Dysfunctions & Interventions
- Relaxation Techniques
- Counselling for special scenarios
  - Domestic Violence, LGBTQ
- Self-awareness and Burnout/self-care

### Course Details

**Date:** Saturdays 9.0oam - 4.3opm
**Commencement:** 13th January 2018
**Course Duration:** 4 Months
**Course Fee:** RS. 50,000/-
(10% discount if the total course fee is made before the commencement)
**Medium:** Sinhala
**Contact:** Badra 077 9 89 52 52

**The Family Planning Association of Sri Lanka**
37/27, Bullers Lane, Colombo - 07 ☏: +94112555455 🖷: +94112556611
E-mail : badra@fpasrilanka.org Web: vvww.fpasrilanka.org
Registered as a Guarantee Limited Company. Registration No : GA 585
www.fpasrilanka.org



## වෘත්තීය උපදේශන ක්ෂේත්‍රයේ අනාගත රැකියා සඳහා
### වෘත්තිකයින් නිර්මාණය කිරීම. . .

- අනාගත වෘත්තීය අවස්ථා බහුල ක්ෂේත්‍රයක වෘත්තීමය අධ්‍යාපනයක් සොයන අයට. . .
- මනෝ විද්‍යා හා වෘත්තීය උපදේශනයේ නියුතු උපදේශක වරුන්ට, ගුරුවරුන්ට. . .
- උපදේශන හා සමාජ වැඩ ක්ෂේත්‍රයන්හි ඉගෙනීමට අපේක්ෂා කරන යෞවන යෞවනියන්ට. . .

වැඩ බිමට මනෝ විද්‍යාව. . .
වෘත්තීය උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව

කාල සීමාව වසරකි
සෑම සෙනසුරාදා දිනකම පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා
දිනය : 2018/01/06
විමසීම් : 0779 89 52 52 - භද්‍රා

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය
37/27, බුලර්ස් පටුමග, කොළඹ - 07.
☏: + 94 112 555 455 🖷: + 94 112 55 66 11
E-mail : badra@fpasrilanka.org Web : www.fpasrilanka.org
Registered as a Guarantee Limited Company. Registration No : GA 585

VISION2020
Sexual and reproductive health rights for all

සංස්කරණය : ආනන්ද බෝධිනායක - ananda@fpasrilaka.org
සම්බන්ධීකරණය : අධිවාචන (Advocacy) ඒකකය

# හදිසි ආපදා තත්ත්වයකදී කාන්තාවන් සහ ගර්භනී මව්වරුන් පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමු...

2017 මැයි මාසයේ අප රට තුළ සිදු වූ අධික වර්ෂා තත්ත්වය සමඟ ගංවතුර සහ නායයෑමෙන් දරුණු විපත් රැසක් සිදුවිය. ලක්ෂ පහකට අධික පිරිසකට මෙහි බලපෑම් සිදු වූ අතර 200 කට අධික පිරිසක් මිය ගියහ.



එක්සත් ජාතීන්ගේ ජනගහනය අරමුදලේ ශ්‍රී ලංකා නියෝජිත රිට්සු නැක්කෙන් මහත්මිය ජංගම වෛද්‍ය සායනයකදී ආධාර බෙදා දුන් අවස්ථා... ජ්‍යෙෂ්ඨ හෙදි නිලධාරිනී දමයන්ති බණ්ඩාරනායක මහත්මිය ද ඡායාරූපයෙහි වේ.



කළුතර දිස්ත්‍රික් ලේකම් යූ.ඩී.සී. ජයලාල් මහතාට ආධාර බාරදෙමින්... සහකාර අධ්‍යක්ෂ, මහජන සම්බන්ධතා සහ මාධ්‍ය ආනන්ද බෝධිනායක මහතා

මෙවැනි භයානක ස්වාභාවික විපත් සිදුවන අවස්ථාවක කාන්තාවන් සහ ගැහැණු ළමුන් පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණකි.







මෙවැනි අවස්ථාවක කාන්තාවන් සහ ගැහැණු ළමුන් ලිංගික හිංසනයට, අනපේක්ෂිත ගැබ්ගැනීමකට ලිංගාශ්‍රිත රෝගයකට ගොදුරුවීමට වැඩි අවදානමක් ඇත. එමෙන්ම ගර්භනී මව්වරුන්ට අවශ්‍ය පූර්ව ප්‍රසව සෞඛ්‍ය පහසුකම් ඇතැම්විට නොලැබීයාමේ අවදානමක්ද පවතී.

මෙවැනි තත්ත්ව පිළිබඳ අවබෝධය ලබාදීම සඳහා SPRINT ව්‍යාපෘතිය මගින් ස්වාභාවික විපත් බහුල දිස්ත්‍රික්කයන්හි ආපදා කළමණාකරන කටයුතුවල නිරත පුද්ගලයින් වෙනුවෙන් "හදිසි ආපදා තත්ත්වයකදී ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය අවම මූලික ප්‍රමිතීන්" ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළු කිහිපයක් සංවිධානය කරණ ලදී.

මීට අමතරව ජංගම සායන 42ක් පවත්වා සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙන් කාන්තාවන් සඳහා අවශ්‍ය මූලික ද්‍රව්‍ය සහිත කට්ටල හයදහසක් පමණ ද මව්වරුන් සඳහා අවශ්‍ය කට්ටල දෙදහස් පන්සියයකට වැඩි ප්‍රමාණයක් ද ගංවතුර සහ නායයෑම් සිදුවූ දිස්ත්‍රික්වල බෙදා දීමට සිදු විය.



ශ්‍රී ලංකා යුධ හමුදාවේ වෛද්‍ය බලකායේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින් සඳහා කුකුලේගඟ Laya Leisure හි පැවැති වැඩමුළුවට එක්වූ පිරිස ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ වෛද්‍ය අධ්‍යක්ෂ ප්‍රජා වෛද්‍ය විශේෂඥ හරිස්චන්ද්‍ර යකන්දාවල, සහකාර අධ්‍යක්ෂක රංගික වික්‍රමගේ සහ කළමණාකරන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් ජී. එල්. එස්. සේනාධීර යන මහත්වරුන් සමඟ සමූහ ඡායාරූපයක

# ගෝලීය අරමුදලේ දකුණු ආසියා HIV ව්‍යාපෘතිය - GFMSA

මෙම ව්‍යාපෘතිය යටතේ මහජන සෞඛ්‍ය, නීති සහ නීතිය බලාත්මක කරන ආයතන, මානව හිමිකම් සහ මාධ්‍ය ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින් උදෙසා HIV අවම කිරීම සඳහා පැවැති වැඩමුළුවේ අවස්ථා.




ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිශ්චයකාර ශිරාණි තිලකවර්ධන මහත්මිය දේශනය පවත්වමින්...




මනෝ වෛද්‍ය විශේෂඥ කපිල රණසිංහ මහතා දේශනය පවත්වමින්....

# කාන්තා හිංසනය වළක්වාගැනීම පිළිබඳව දැනුවත් කිරීම් මාතර දී...



මාතර පොලිසියේ ළමා හා කාන්තා කාර්යංශ ප්‍රධානී වරුණි බෝගහවත්ත මහත්මිය ගංවතුරෙන් විපතට පත් පිරිස් අතර වූ කාන්තාවන් හට කාන්තා හිංසනය වළක්වාගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ දේශනයක් පවත්මින්...

**ජංගම වෛද්‍ය සායන**



ලිලී ව්‍යාපෘතිය යටතේ පැවති ජංගම වෛද්‍ය සායනයක අවස්ථා... කළමණාකාරිනී සුනීතා රත්නායක මහත්මිය ද ඡායාරූපයේ වේ.

**දැනුවත් කිරීමේ වැඩසටහන්**



FPA සුව සේවා මධ්‍යස්ථානය - නුවරඑළිය උඩුපුස්සැල්ලාව ඇබර්නට් ලංකා පෞද්ගලික සමාගමේ සේවිකාවන් සඳහා ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවති අවස්ථාව....

INTERNATIONAL YOUTH DAY

#YouthDay #Youth4Peace

# අද සහ හෙට වෙනුවෙන් තාරුණ්‍යයේ සාමය සහ සුරක්ෂිතභාවය තහවුරු කරමු.

“ වර්තමානයේ තරුණ ප්‍රජාව ලොව වටා සිටින **විශාලතම** සහ **සන්නද්ධ ගැටුම්වලින් බලපෑමට ලක්වූ ජනගහනයේ** බහුතරය වේ. ”

“ **අධ්‍යපනය සහ ආර්ථික අවස්ථා** සඳහා තරුණයන්ගේ ප්‍රවේශය වැළැක්වීම, තිරසාර සාමය හා පතිසංවිධානය සඳහා බලපෑමක් ඇත. ”




“ අඛණ්ඩ **සාමය හා යුක්තිය සහ ප්‍රතිසංවිධානයට** දායකවීම සඳහා තරුණයින් ක්‍රියාකාරීව ක්‍රියා කළ යුතුය. ”

“ ලෝක ජනගහනයෙන් විශාල පිරිසක් **සුවිශේෂ ජන කාණ්ඩයක්** ලෙස වාර්තාවන මොහොතේ ඔවුන් **ඇතුළත්වන ප්‍රතිපත්ති** වේ නම් සාමය සහ ආර්ථික සංවර්ධනයට එය බලපානු ඇත. ”

## ඒ සඳහා...



සහභාගිත්වය ඉහළ නංවමු



රැකවරණය සහ සුරක්ෂිතභාවය තහවුරු කරමු



අවියෙන් සන්නද්ධවීම වළක්වමු



හවුල්කරුවන්, පාර්ශ්වකරුවන් වෙමු



අවි අතහැර සමාජගත වෙමු












# ගෝලීය අරමුදලේ HIV ව්‍යාපෘතියේ ජාතික සමාලෝචන සැසිය

ගෝලීය අරමුලදේ HIV ව්‍යාපෘතිය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනේ මඟ පෙන්වීම යටතේ, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය විසින් ශ්‍රී ලංකාව තුළ HIV ව්‍යාප්තිය අවම කිරීම සඳහා ක්‍රියාත්මකවන ව්‍යාපෘතියකි.

මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධව කටයුතු කරන වෙනත් රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන, දිස්ත්‍රික් නියෝජිතයින් එක්කරමින් ව්‍යාපෘතියේ කටයුතු සමාලෝචන කිරීම මෙම ජාතික සමුළුවේ අරමුණ විය.

හෙක්ටරේ කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනයේ දී මෙම ජාතික සමාලෝචනය පැවති අවස්ථාව.





*ජාතික ලිංගාශ්‍රිත රෝග හෝ ඒඩ්ස් මර්දන වැඩසටහනේ අධ්‍යක්ෂ සිසිර ලියනගේ මහතා, අසිත පුංචිහේවා මහතා, විධායක අධ්‍යක්ෂිකා හා ව්‍යාපෘති අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ මත්මිය, විශේෂඥ වෛද්‍ය සත්‍යා හේරත් මහත්මිය, විශේෂඥ වෛද්‍ය ජානකී විදානපතිරණ මහත්මිය, නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා, මහජන සම්බන්ධතා සහ අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදූ දිසානායක මහත්මිය*

## මාධ්‍ය වැඩමුළුව - තිරසාර සංවර්ධනය සඳහා පවුල් සැලසුම

තිරසාර සංවර්ධනයට - පවුල් සැලසුම තේමාකර ගනිමින් මාධ්‍යවේදීන් සඳහා වැඩමුළුවක් ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ප්‍රධාන කාර්යාලයේ දී පැවැත්වුණි.




*ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ මහත්මිය සභාව අමතමින්...*



*සහභාගිවූ මාධ්‍යවේදීන් (වම් ඡායාරූපයේ)*
*පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ විශේෂඥ වෛද්‍ය සංජීව ගොඩකන්ද මහතා, මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා මහතා, පවුල් සංවිධාන සංගමයේ ගරු ලේකම් වෛද්‍ය එස්ටර් අමරසේකර මහත්මිය, අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදූ දිසානායක මහත්මිය, වෛද්‍ය අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය හරිස්චන්ද්‍ර යකන්දාවල මහතා (දකුණු ඡායාරූපයේ)*

## ප්‍රංශයේ, පැරිස් නුවර පැවති HIV සමුළුවට සහභාගී වෙමින්...



HIV අවදානම වළක්වා ගැනීම ඉලක්ක කරමින් ලොව පුරා අවධානය ඒ සඳහා යොමුකිරීමට ප්‍රංශයේ පැරිස් නුවර පැවැති HIV පිළිබඳ සමුළුවට ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ මහජන සම්බන්ධතා හා අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදූ දිසානායක මහත්මිය සහ ගෝලීය අරමුදලේ දකුණු ආසියාන කලාපීය HIV ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමණාකාරිනි දෙව්මි දම්පැල්ල මෙනවිය සහභාගී වූහ.